# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

## නාට්‍යය හා රංග කලාව - II

නම/ විභාග අංකයඃ ......................................... කාලය පැය 2යි

**පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01)

i. දික්තල කාළගෝල නාට්‍යයේ මූලාශ්‍රය නම් කරන්න. (ල 2)

ii. මෙහි දක්නට ලැබෙන නාට්‍යධර්මී ලක්ෂණ දෙකක් ලියන්න. (ල 2)

iii. වර්තමාන සමාජයට මෙම නාට්‍යයෙන් දෙන ආදර්ශ දෙකක් දක්වන්න. (ල 2)

iv. මූලාශ්‍ර කතාවේ සහ නාට්‍යයේ අතර වෙනස කරුණු දෙකක් දක්වන්න. (ල 2)

v. “අම්බරයේ සඳ සේ දිලී” ගීත කොටස ගයන්නේ කවුරුන් ද? කා හටද? (ල 2)

vi. මෙම නාට්‍යයේ දක්නට ඇති නාඩගම් ලක්ෂණ දෙකක් ලියන්න. (ල 2)

02)

i. කොහොඹා කංකාරිය ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු දෙකක් ලියන්න. (ල 2)

ii. කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ උපත් කතාව සැකෙවින් දක්වන්න. (ල 4)

iii. කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ නාට්‍යමය අවස්ථා හතරක් දක්වා ඉන් එකක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ පහදන්න. (ල 6)

03)

i. වේශ භූෂණය යනු කුමක්ද? (ල 2)

ii. වේශ භූෂණය නාට්‍යයකට වැදගත් වන්නේ ඇයි? කරුණු 4 දක්වන්න. (ල 4)

iii. වේශ භූෂණ ශිල්පියා වේෂ භූෂණයේ දී සැළකිය යුතු කරුණු හතරක් දක්වා ඉන් එකක් පහදන්න. (ල 6)

04)

i. නාට්‍ය පෙළක් යනු කුමක්ද? (ල 2)

ii. කතන්දරයක සහ නාට්‍ය පෙළක සමානතා/ අසමානතා දෙක බැගින් දක්වන්න. (ල 4)

iii. නාට්‍යයක ගැටුම් අවස්ථා යනු මොනවාද යන්න කෙටි පැහැදිලි කිරීමක් දක්වා ඔබ උගත් නාට්‍යයන්හි ගැටුම් අවස්ථා තුනක් දක්වන්න. (ල 6)

05)

i. සොකරි නාටකය පැවැත්වෙන ප්‍රදේශ හතරක් දක්වන්න. (ල 2)

ii. සොකරි කතා පුවත සැකෙවින් ලියන්න. (ල 5)

iii. සොකරි ගැමි නාටකයේ රංග ශෛලිය පහදන්න. (ල 5)

06)

i. හෙන්රි ජයසේනයන් රංගනයෙන් දායක වූ චිත්‍රපට හෝ ටෙලිනාට්‍ය දෙකක් දක්වන්න. (ල 2)

ii. ඔහුගේ ස්වතන්ත්‍ර නාට්‍ය තුනක් සහ පරිවර්තන නාට්‍ය දෙකක් දක්වන්න. (ල 5)

iii. ඔහුගෙන් සිංහල නාට්‍ය කලාවට වූ සේවය අගයන්න. (ල 5)

07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකිය.

සියලුම නෑදෑ හිත මිතුරන්ගේ සතුටු සිනා ආශිර්වාද මැද අර්ජුන සහ දේදුනු සුබ මොහොතින් පෝරුව මතට ගොඩ විය. අෂ්ඨක ගායනා කරන්නාගේ ආශිර්වාද ගායනා හෝටලය පුරා උස් හඬින් ගලා යයි. වාහනයක වේගවත් තිරිංග හඬක් සමඟ මොහොතකින් කිසිවෙකු හෝටලයේ දොරකඩ සිටිනු සියලු දෙනාට පෙණින. …………………. එතැන් සිට

i. පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය ලෙස රංග විධාන සහ සංවාද රචනය (ල 4)
ii. චරිත අතර ගැටුමක් ඇතිවන ආකාරයට අවස්ථාව ගොඩ නැංවීම (ල 4)
iii. කුතුහලය පිරි නොසිතූ අවසානයක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය (ල 4)